**ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - 2015**

---

ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ 2015 ජනවාරි 01 දින සිට 2015 නොවැම්බර් 30 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව සමඟ එළඹී ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සහ 2007 ජුනි 06 දිනැති අංක 2276 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ද්විතීයික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. උතුරු මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශ සහ මඩකලපුව, හම්බන්තොට සහ පොලොන්නරුව දිස්ත්‍රික්කවල නාගරික ප්‍රදේශවල 969,000 ක් වන ජනතාවට සුරක්ෂිත ජලය සැපයීම ද පවුල් 32,572 ක් සඳහා සනීපාරක්ෂාව ද සැපයීමත් ජල කේන්ද්‍රික ආයතන සවිබල ගැන්වීම මඟින් සුරක්ෂිත ජලය සැපයීමේ ධාරිතාව වැඩිකිරීමත් ව්‍යාපෘතියේ අරමුණු වේ. 2003 අගෝස්තු 18 දිනැති අංක 1993 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යටතේ ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත රු.මිලියන 5,803 කට සමාන එජඩො මිලියන 60.29 ක් ආසියානු සංවර්ධන බැංකුව මූලිකව ප්‍රතිපාදනය කර තිබුණු අතර පසුව 2007 ජුනි 06 දිනැති අංක 2276 එස්ආර්අයි (එස්එෆ්) ණය ගිවිසුම යටතේ රු.මිලියන 4,336 කට සමාන එජඩො මිලියන 39.81 ක අතිරේක ණය පහසුකමක් සැපයීමට අනුමත කර තිබුණි. 2010 ජුනි 30 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිත වුවත් එහි කාලය 2014 ජුලි 31 දින දක්වා දීර්ඝ කර තිබුණු අතර, එහි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2015 නොවැම්බර් 30 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්

ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් පිළිබඳව ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති සාධාරණ විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය දෙන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහාම උපයෝජනය කරන ලද්දේ ද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමෙහි නියම කර ඇති මූල්‍ය ප්‍රතිඥාවන්ට අනුකූල බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2015 නොවැම්බර් 30 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2015 නොවැම්බර් 30 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව සහ

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

**2.2 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්**

1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 08 වන වගන්තිය ප්‍රකාරව වටිනාකම රු.මිලියන 5 හෝ ඊට වැඩි කොන්ත්‍රාත් භාර ගනු ලබන කොන්ත්‍රාත්කරුවන් පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි විය යුතුය. එසේම ටෙන්ඩර පිරිනැමීමෙන් දින 60 ක් ඇතුළත ටෙන්ඩර් ගිවිසුම පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ යුතුය. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල නියුතු කොන්ත්‍රාත්කරුවන් විසින් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ සහ 2015 නොවැම්බර් 30 දින දක්වා අරමුදල් මූල්‍යයනය හා උපයෝජනය කිරීම සම්බන්ධ විශේෂිත සංඛ්‍යා විස්තර කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවය** | **ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල** | | **අරමුදල් උපයෝජනය** | | | |
|---|---|---|---|---|---|---|
| | | | **සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ** | | **2015 නොවැම්බර් 30 දිනට** | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ.සං.බැ. | 48.80 | 5,323 | - | - | 48.80 | 5,490.94 |
| ශ්‍රී ලං ර | 41.87 | 4,568 | 0.64 | 87.52 | 38.24 | 4,382.63 |
| එකතුව | 90.67 | 9,891 | 0.64 | 87.52 | 87.04 | 9,873.57 |

ව්‍යාපෘතියේ කාර්යයන් කරගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් නගර සැලසුම් සහ ජල සම්පාදන අමාත්‍යාංශයේ 2015 අයවැය ඇස්තමේන්තු යටතේ වෙන්කර ඇති බව නිරීක්ෂණය කරන ලදී.

**3.2 භෞතික ප්‍රගතිය**

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, හම්බන්තොට සහ මඩකලපුව නගරවල ජල කුළුණු ඉදිකිරීම්, ආරම්භක ස්ථානීය වැඩ, පිරිපහදු නොකළ ජල සම්ප්‍රේෂණය සහ පිරිපහදු යන්ත්‍ර සහ ජලය බෙදාහැරීම සඳහා නල සැපයීම සහ එළීමට සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මූතූර් හි වැසි දිය ප්‍රවාහනය සම්බන්ධයෙන් වූ ඉදිකිරීම් 04 කට අදාළ කොන්ත්‍රාත් දින 125 සිට දින 710 දක්වා වූ කාල ප්‍රමාදයක් සහිතව 2015 නොවැම්බර් 30 දින වන විට සම්පූර්ණ කර තිබුණි.

**3.3 මතභේදයට තුඩුදෙන කරුණු**

---

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ උන්නත කුළුන ඉදිකිරීමේ කාර්යයන් 2012 අප්‍රේල් මස වන විට සම්පූර්ණ කර පැවතියත් 2016 ඔක්තෝබර් මස වන විටත් අදාළ භූමියෙහි අයිතිය ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පැවරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 මූල්‍ය පාලනය සම්බන්ධ සිද්ධි**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි අංක 133 හා 2010 ජුලි 26 දිනැති අංක ඩීඑම්ජී/2010 (05) දරන කළමනාකරණ සහ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජලසම්පාදන හා ජලපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ භෞතික පරීක්ෂාවට ලක්කර නොතිබුණි. තවද, 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණි.

**3.5 ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම**

---

2015 නොවැම්බර් 30 දිනට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර ඇතත් ව්‍යාපෘතිය විසින් මිලදී ගත් වත්කම් භාර දෙන ලෙස සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ පරමාර්ථ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලෙස ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය වෙත උපදෙස් නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි.